දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය -2020 (පුනර් 2016) - 2022 පෙබරවාරි / මාර්තු
First Examination in Arts (External) - 2020 (Repeat 2016) – February / March 2022

ආවිප්‍ර 1.1 - ආර්ථික විශ්ලේෂණය
EC 1.1 – Economic Analysis

කාලය පැය (03) තුන යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.

---

1. (i) ආර්ථික සම්පත්වල ප්‍රභේද හතර උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 05)
   (ii) නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මධ්‍යගත සැලසුම් ආර්ථිකයකින් වෙනස් වන්නේ කවර ආකාරයෙන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)
   (iii) ආර්ථික විද්‍යාව තුළ මුදල් ප්‍රාග්ධනය ලෙස නොසලකන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)
   (iv) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ රජයට හිමි කාර්යභාරය කුමක්ද? (ලකුණු 05)

2. (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය (PPC) යන්න අර්ථ දක්වා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මාණය කිරීමේ දී යොදා ගන්නා උපකල්පන දක්වන්න. (ලකුණු 05)
   (ii) මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් එම හැඩය ගැනීමට හේතු සුදුසු භාණ්ඩ වර්ග දෙකක් උදාහරණ ලෙස යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   (iii) යෝග්‍ය රූපසටහන් යොදා ගනිමින් පහත සඳහන් සිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර සටහනක සලකුණු කොට කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05)
      A. උගතුන් රට හැර යෑම.
      B. ගෑස් හිඟය නිසා ආපන ශාලා තාවකාලිකව වසා තිබීම.
      C. පොහොර හිඟය නිසා වී අස්වැන්න අඩු වීම.
      D. විදුලි බලය බිඳ වැටීම නිසා කර්මාන්ත ශාලාවල යන්ත්‍ර සූත්‍ර අක්‍රියව පැවතීම.

E. රෝහල් ධාරිතාවය ඉක්මවා COVID-19 රෝගීන් වැඩි වීම නිසා තාවකාලික වාට්ටු ඉදි කර ප්‍රතිකාර කිරීම.

F. විදේශ සංචාරකයින්ගේ පැමිණීම අඩු වීම.

(iv) අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා X හා Y අක්ෂවල සඳහන් මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මාණය කරන්න. මෙහි ඇතුලත ඕනෑම ස්ථානයක A නැමැති ලක්ෂය ලකුණු කරන්න . COVID-19 පැතිරීමත් සමග ඔබ ලකුණු කළ A ලක්ෂය A1 යනුවෙන් විතැන් කරන්න. A ලක්ෂය A1 දක්වා විතැන් කිරීමට ඔබ විසින් සැලකිල්ලට ගත් කරුණු දක්වන්න. (ලකුණු 05)

3. (i) කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පවත්නා ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපෑ හැකි සාධක කවරේද ? (ලකුණු 05)

(ii) පසුගිය වසරේ රජය මගින් සහල් සඳහා පැනවූ උපරිම සිල්ලර මිල අසාර්ථක විය.

a. සුදුසු රූප සටහනක් යොදා ගනිමින් උපරිම මිල පැනවීම යන්න විස්තර කරන්න. (ලකුණු 03)

b. ශ්‍රී ලංකා ආණ්ඩුව මගින් පැනවූ ඉහත උපරිම මිල අසාර්ථක වීමට බලපෑ හේතු කවරේද ? (ලකුණු 02)

(iii) 2022 වර්ෂයේ යල කන්නය අවසාන වන විට සහල් මිල පහත හෙළීම සඳහා ඔබට කළ හැකි යෝජනා කවරේද? (ලකුණු 05)


(iv) රට තුළ ඉන්ධන මිල ස්ථාවරව පවත්වා ගෙන යෑම සඳහා ඔබට කළ හැකි යෝජනා කවරේද? (ලකුණු 05)

4. (i) රුපියල් 250,000කට වඩා මාසික ආදායමක් ලබන අයගෙන් බදු අය කර ගෙන එකතු වූ මුළු බදු මුදල් ප්‍රමාණයම රුපියල් 20,000ට වඩා අඩු ආදායම් ලබන අය අතර බෙදා දීමට රජය තීරණය කළ හොත් එමගින් සමාජ සුභසාධනය ඉහළ යන්නේ ද ? ආන්තික උපයෝගීතා න්‍යාය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) පුද්ගලයකුගේ තෘප්තිය උපරිම කිරීම සඳහා සම්පූර්ණ විය යුතු යැයි ඇල්ෆ්‍රඩ් මාෂල් විසින් ඉදිරිපත් කරන ලද කොන්දේසි දෙක දක්වන්න. එම කොන්දේසි බිඳ වැටෙන අවස්ථාවක තෘප්තිය උපරිම නොවන්නේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(iii) සාමාන්‍ය භාණ්ඩයක් සඳහා පවතින ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහතට බෑවුම් වන්නේ මන්දැයි ආන්තික උපයෝගීතා න්‍යාය (Marginal Utility Theory) ඇසුරින් ඔබ පැහැදිලි කරන්නේ කෙසේද ? (ලකුණු 05)

5.




ඉහත රූප සටහනේ දැක්වෙන්නේ පූර්ණ තරගකාරී වෙළෙඳපොළක තනි ආයතනයක් සම්බන්ධ පිරිවැය හා අයභාර තත්ත්වයයි. දී ඇති දත්ත අනුව,

(i) ආයතනයේ ලාභ උපරිම කරන අවස්ථාවේ දී මුළු පිරිවැය, මුළු අයභාරය සහ මුළු ලාභය ගණනය කරන්න . (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිල රුපියල් 9ක් හා රුපියල් 4ක් ලෙස, පහළ ගිය අවස්ථාවල දී ආයතනය ඊට ප්‍රතිචාර දක්වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) මෙම ආයතනය භාණ්ඩ ඒකක 600ක් නිපදවන අවස්ථාවක සාමාන්‍ය ස්ථාවර පිරිවැය ගණනය කරන්න. (ලකුණු 05)

(iv) පූර්ණ තරගකාරි කර්මාන්තයක දිගු කාලයේ දී සෑම ආයතනයක්ම ප්‍රාමාණික ලාභ පමණක් ලබන තත්ත්වයට පත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

6. (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑතකාලීනව ඔබ නිරීක්ෂණය කරන පහත සඳහන් සිද්ධීන් ආර්ථික විද්‍යාත්මකව පැහැදිලි කරන්න.

a මහ බැංකුව විසින් ඇමෙරිකානු ඩොලරයක මිල රුපියල් 202 ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර කළු කඩයේ රුපියල් 240 හෝ ඊට ඉහළ මිලකට අලෙවි වේ. (ලකුණු 05)

b දේශීය කිරි පිටි සැපයුම පෙරට වඩා වැඩි කර ඇතත් දේශීය කිරි පිටි මිල දී ගැනීමට දිගු පෝලිම් දක්නට ලැබේ. (ලකුණු 05)

(ii) තරුණ ශ්‍රමිකයින් විදේශ ගත වීම නිසා

a දේශීය ශ්‍රම වෙළෙඳපොළට ඇති වන බලපෑම සහ (ලකුණු 05)

b ජාතික ආර්ථිකයට ඇති වන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 05)

7. (i) ඕනෑම රටක මහ බැංකුවක් මගින් අලුතින් මුදල් නෝට්ටු මුද්‍රණය කර මුදා හැරීම සිදු විය හැකි අවස්ථා කවරේද? (ලකුණු 05)

(ii) පසුගිය වසරක කාලයක් තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රමාණය ඉක්මවා මුදල් මුද්‍රණය කර ආර්ථිකයට මුදා හැර ඇතැයි චෝදනාවක් පවතී.

a. එසේ මුදල් මුද්‍රණය කර ආණ්ඩුවට මුදා හැරීමට බලපා ඇති හේතු කවරේද ? (ලකුණු 05)

b. මුදල් මුද්‍රණය කිරීම මගින් උද්ධමනයක් ඇති වීම පාලනය කිරීම සඳහා රජයට ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග කවරේද? (ලකුණු 05)

(iii) දේශීය මුදල් සැපයුම වැඩි කිරීම ඩොලර් අර්බුදය තවත් උග්‍ර කරයි. මෙම ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

8. (i) 2020 වර්ෂයේ ශ්‍රී ලංකාව -3.6ක ආර්ථික වෘද්ධි වේගයක් වාර්තා කිරීමට මූලිකවම හේතු වූ කරුණු කවරේද ? (ලකුණු 05)

(ii) Y = C + I + G + (X -M) සමීකරණය අනුව රටක ආනයන අඩු වීම දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට හේතු විය යුතුය. ශ්‍රී ලංකාවේ පසුගිය වසරේ දිගින් දිගටම ආනයනය කළ භාණ්ඩ සීමා කරන ලදී. මෙසේ ආනයන සීමා කිරීම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ යන්නට හේතු වේ යැයි ඔබ සිතන්නේද? එසේ නොවන්නේ නම් ඊට හේතු කවරේද? (ලකුණු 10)

(iii) දැනට ඩොලර් 1= රුපියල් 202 ලෙස ප්‍රකාශයට පත් කර ඇති විනිමය අනුපාතිකය එහි සැබෑ අගයට ළඟා වීමට පාලනයෙන් මුදා හරිනු ලැබුව හොත් ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය මිනුම් කිරීමට යොදා ගන්නා ආර්ථික දර්ශකවලට කුමක් විය හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

9. (i) පහත සඳහන් මාතෘකා අතුරින් <u>**හතරක්( 04)**</u> තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

a. ශ්‍රී ලංකාවේ ණය අර්බුදය

b. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ක්ෂය වීම.

c. ශ්‍රී ලංකාවේ වර්තමාන උද්ධමනය

d. ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකය දැනට මාස කිහිපයක් තිස්සේ පාවීමට ඉඩ නොහැරීමේ වාසි සහ අවාසි

c. 2022 වර්ෂයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ වෘද්ධි වේගය ඉහළ නැංවීමට එරෙහිව රජයට මුහුණ පෑමට සිදු වන අභියෝග (ලකුණු 5x4=20)

*******************